ශාස්ත්‍ර පීඨය
ශාස්ත්‍රවේදි පළමු වසර පරීක්ෂණය
පළමු සෙමෙස්තරය – 2016/2017

**SLG 1101– භාෂා ප්‍රවේශය**

(පැ. දෙකයි)

ප්‍රශ්න <u>හතරකට</u> (04) පමණක් පිළිතුරු සපයන්න.

---

1. භාෂා අධ්‍යයන ඉතිහාසයේ සන්ධිස්ථාන දක්වා නූතන වාග්විද්‍යාව ඊට කලින් පැවති භාෂාධ්‍යයන සම්ප්‍රදායන්ගෙන් වෙනස් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

2. භාෂාව අරබයා නූතන වාග්විද්‍යාඥයකු ඉදිරිපත් කළ නිර්වචනයක් දක්වා මානව භාෂාවේ ලක්ෂණ විභාග කරන්න.

3. "භාෂාවේ ඇති එක් මූලික ප්‍රභේදයක් වන්නේ 'කියන බස' හා 'ලියන බස' අතර පවත්නා වෙනස යි." සිංහල භාෂාව ඇසුරෙන් විමසන්න.

4. "ව්‍යාකරණය යනු රීති සමුදායකි." සිංහල භාෂාව ඇසුරින් පැහැදිලි කරන්න.

5. 'මිශ්‍ර සිංහල හෝඩියේ අක්ෂර සංඛ්‍යාව 60 දක්වා වැඩි වී ඇත.' සාකච්ඡා කරන්න.

6. <u>**එක්කෝ,**</u>
   'භාෂා පරිණාමය' යනු කුමක්දැයි පැහැදිලි කොට සිංහල භාෂාවේ ඉතිහාසය පිළිබඳ යුග බෙදීමක් ඉදිරිපත් කරන්න.
   <u>**නැතහොත්,**</u>
   "භාෂා සංස්පර්ශය ජීව භාෂාවක අනිවාර්ය ලක්ෂණයකි." පැහැදිලි කරන්න.

7. "සිංහල භාෂණයේ ප්‍රාදේශික විවිධත්වයක් දැකිය හැකිය." විමසන්න.

8. සමාජීය විවිධත්වය අනුව සිංහල භාෂාවේ දැකිය හැකි වෙනස්කම් පිළිබඳ විමසීමක් කරන්න.

*******************